#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Mawbima #Lankadeepa #December6

යම් ප්‍රවෘත්තියකට අදාළ පුද්ගලයෙකුගේ වර්ගය පිළිබඳ විස්තර පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුත්තේය යනුවෙන් මාධ්‍ය වෘත්තිය ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් වේ. පහත දැක්වෙන්නේ ඒකල මුඩු ඉඩමක කොන්ක්‍රීට් කාණුවක් යට තිබී යුද ටැංකි නාශක කාලතුවක්කු උණ්ඩ දෙකක් සොයාගැනීමේ සිදුවීම පුවත්පත් තුනක් ඔස්සේ වාර්තා කොට ඇති ආකාරයයි. එහිදී දිවයින පුවත්පතේ මෙම ඉඩම අයත් වන්නේ කොළඹ පදිංචි ද්‍රවිඩ ජාතිකයෙකුට බව සඳහන් වන අතර, ලංකාදීප සහ මව්බිම පුවත්පත් තුළ කිසිවෙකුගේ ජාතිකත්වයක් සඳහන් නොවේ.

මෙම ප්‍රවෘත්තිය සඳහා එම ඉඩම අයත් පුද්ගලයාගේ ජාතිකත්වය සෘජුව අදාළ වන්නේද? එසේත් නැතිනම් එම පුද්ගලයාගේ ජාතිකත්වය සඳහන් කිරීම ඔස්සේ සිදුවී ඇත්තේ ප්‍රවෘත්තියේ සඳහන් වන කරුණු වලට වඩා වැඩි
යමක් ඉඟි කිරීමට උත්සාහ ගැනීමක්ද? එය මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයක් නොවන්නේ යැයි ඔබ සිතන්නේද?